# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 11,832 — 1959 අගෝස්තු 14 වැනි සිකුරාද — 14.8.1959

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී).


## IV වැනි කොටස — පළාත් පාලනය

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... | 679 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශ ... | — |
| තනතුරු—ඇබෑර්තු ... ... | — | අය-වැය ලේඛන ... ... | 685 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... | 682 | දේපල. විකිණීම ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... | 684 | මාගී කොමිටි දැන්වීම් ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් ... ... ... | — | විවිධ දැන්වීම් ... ... | 685 |


## පළාත් පාලන නිවේදන

ඇල්. ජී. ඞී.—ජී. සී. 14/13.

### වැල්ලව ගම්කාරයී සභාව

**මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණත**

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණතේ (201 වැනි පරිච්ඡේදයේ) 22 වැනි වගන්තිය යටතේ විධිවූ බලමණ්ඩලය විසින්, එනම්, කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැල්ලව ගම්ප්‍රදේශයේ ගම්කාර්ය සභාව විසින් සම්පාදිතව, 1947 ක්වූ සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරන ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිතවූ එකී වගන්තියෙන් පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ අමාත්‍ය තුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් ස්ථිර කරන ලද නියෝග.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ
අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1959 ජූලි මස 28 වැනි දින,
කොළඹදීය.

**නියෝග**

1. ආඥාපණතේ 21 වැනි වගන්තිය යටතේ ප්‍රකාශකරන ලද මස් පිණිස සතුන් මරණ පොදු ස්ථානය සෞඛ්‍ය පිළිබඳ වෛද්‍යනිලධාරි තුමා භාරයේ තිබිය යුතුය. එහි මනා පරිපාලනය හා සනීපාරක්ෂාව සම්බන්ධයෙන් එකී නිලධාරියා විසින් වග කිය යුතුයි.

2. (1) කිසිම අයෙකු විසින් කිසිම සතෙකු (ඒ) ඒ සතා පරීක්‍ෂා කර බැලීම පිණිස සෞඛ්‍යය පිළිබඳ වෛද්‍ය නිලධාරී තුමා විසින් හෝ සෞඛ්‍යය පිළිබඳ වෛද්‍ය නිලධාරිතුමා විසින් බලය පවරන ලද නිලධාරියෙකු විසින් හෝ පරීක්ෂාකොට මිනිසුන්ට ආහාර පිණිස මරනු ලැබීමට සුදුසු යයි අනුමතකර තිබේ නම්, හෝ

(බී) පූර්වභාග 7 ටත් 9 ටත් අතර කාලයේදී, හෝ මිස නැත්නම් සතුන් මරන ස්ථානයේදී නොමැරිය යුතුයි. එහෙත් කවර අවස්ථාවක දී වුවත් මෙහි සඳහන් වේලාවට වඩා වෙනස්වූ යම් වේලාවක යම් සතකු මැරීම සඳහා ප්‍රධාන තුමා විසින් බලය දිය හැකිය.

(2) කිසිම අයකු විසින් කිසිම සතකු—

(ඒ) (1) වෙනි ඡේදය යටතේ ඒ සතා මැරීම සඳහා අනුමතකළ වේලාවේ සිට පැය 72ක කාලයක් ගතවූවාට පසු කොයියම් වේලාවක, හෝ

(බී) (1) වෙනි ඡේදය යටතේ අනුමත කළාට පසු ඒ සතා සතුන් මරන ස්ථානයට අයිති භූමියෙන් පණපිටින් ඉවත්කර ඇත්තේ නම් ඒ සතා නැවතත් පරීක්‍ෂාකොට මිනිසුන්ට ආහාර පිණිස මරනු ලැබීමට සුදුසු යයි ඒ ඡේදය යටතේ නැවතත් අනුමත කරන ලද්දේ නම් මිස නැත්නම් සතුන් මරන ස්ථානයේදී නොමැරිය යුතුයි.

3. සතුන් මරන ස්ථානයට යම් සතකු ගෙන එන සෑම අයකු විසින්ම ඒ සතා සතුන් මරන ස්ථානයට අයිති භූමියෙහි නවත්වා තබන කාලය තුළ ඒ සතාට සෑහෙන පරිදි කෑම බීම නිසැකව ලැබීම සඳහා අවශ්‍යවූ සෑම පිළියෙලක්ම යොදගත යුතුයි.

4. සතුන් මරන ස්ථානයට යම් සතකු ගෙන එන සෑම අයෙකු විසින්ම ඒ සතා මරනු ලැබීමට සුදුසු නැතැයි ප්‍රතික්‍ෂෙප කරන ලද්දේ නම් එසේ ප්‍රතික්‍ෂෙප කළ වහාම ඒ සතා ඒ ස්ථානය පිහිටි භූමියෙන් ඉවත් කළ යුතුයි. නැත හොත් ඉවත් කරවිය යුතුයි.

5. යම් සතකු 2 වෙනි නියෝගය යටතේ මරනු ලැබීමට සුදුසු යයි අනුමත කළාට පසු ඒ සතා ලෙඩ සහිත බව හෝ මිනිසුන්ට ආහාර පිණිස මැරීම නුසුදුසු බව පෙනී ගියොත්, සෞඛ්‍ය පිළිබඳ වෛද්‍ය නිලධාරිතුමා විසින් හෝ 2 වැනි නියෝගයේ සඳහන් නිලධාරි තුමා විසින් හෝ ඒ සතා මැරීම තහනම් කළ හැකියි.

6. සතුන් මරන ස්ථානයේදී මරන ලද යම් සතකුගේ මස් හෝ අතුනු බහන් ආදිය සෞඛ්‍ය පිළිබඳ වෛද්‍ය නිලධාරිතුමාගේ නොහොත් 2 වෙනි නියෝගයේ සඳහන්වූ නිලධාරි තුමාගේ කල්පනාවේ හැටියට ලෙඩ සහිතව හෝ මිනිසුන්ගේ ආහාරයට නුසුදුසුව හෝ තිබේ නම් එතුමා විසින් ඒ මස් හෝ අතුනු බහන් ආදිය වහාම විනාශ කර දැමීමට සැලැස්විය යුතුයි. එසේ නැතහොත් ඒ මස් හෝ අතුනු බහන් ආදිය විකිණීම පිණිස තැබීම හෝ මිනිසුන් විසින් ආහාර පිණිස ගැනීම හෝ වලකින අන්දමින් ඉවත් කරවිය යුතුයි.

7. සතුන් මරන ස්ථානය භාරවූ නිලධාරි තුමා විසින් මිනිසුන්ගේ ආහාරය පිණිස මරනු ලැබීමට සුදුසුයයි අනුමතකර නැත්තාවූ හෝ 5 වැනි නියෝගයේ විධිවිධාන පරිදි මැරීම තහනම් කර තිබෙන්නාවූ හෝ කිසිම සතකු මැරීමට අවසර නොදිය යුතුයි.

8. (1) කිසිම අයකු විසින් මිනිසුන්ගේ ආහාරයට නුසුදුසු යයි 6 වැනි නියෝගය යටතේ ප්‍රකාශ කරන ලද කිසිම මසක් හෝ අතුනු බහන් ආදියක් සෞඛ්‍ය පිළිබඳ වෛද්‍යනිලධාරි තුමාගේ හෝ 2 වැනි නියෝගයේ සඳහන්වූ නිලධාරි තුමාගේ නියමය යටතේ මිස නැත්නම් සතුන් මරන ස්ථානයෙන් ඉවත් නොකළ යුතුයි.

(2) කිසිම අයකු විසින් මිනිසුන්ගේ ආහාරය පිණිස අදහස් කරන ලද යම් සතකුගේ කුනුපය ඒ කුනුපයේ ඉස්සරහ ගාත්වලත් පස්ස ගාත් වලත් සතුන් මරන ස්ථානය භාරවූ නිලධාරිතුමා විසින් "V. C. Wellawa" යන මුද්‍රාව පිහිටුවා තිබේ නම් මිස නැත්නම් සතුන් මරන ස්ථානයෙන් ඉවත් නොකළ යුතුයි.

9. අනික් සතුන් ඉදිරියේදී හෝ ඒ ස්ථානයෙහි කලින් මරන ලද යම් සතකුගේ කුනුපය ඉවත් කර හෝ මූවා කර, ස්ථානය සුද්ධ පවිත්‍ර කරන තුරු හෝ කිසිම සතකු නොමැරිය යුතුයි.

10. කිසියම් වසන්ගත රෝගයකින්, සමේ රෝගයකින් හෝ බෝවන රෝගයකින් පෙලෙන්නාවූ හෝ ලඟදී පෙලුනාවූ හෝ එබඳු රෝගයකින් පෙලෙන කෙනෙකුට ලඟදී සාත්තු කිරීමෙහි යෙදී සිටියාවූ කිසිම කෙනෙකුට එකී රෝගය බෝවීමට හා රෝග බීජයන් මෝරනු ලැබීමට ගතවන කාල සීමාවන් පසුවන තුරු යම් සතුන් මරන ස්ථානයක් භාරව සිටින අයකු විසින් එකී සතුන් මරන ස්ථානයට ඇතුල්වීමට හෝ යම් සතකු මැරීමේ කටයුත්තකට සහභාගි වීමට හෝ ඉඩ නොදිය යුතුයි.

11. (1) සතුන් මරන ස්ථානය පාවිච්චි කිරීම ගැන පහත සඳහන් වන අන්දමේ ගාස්තුවක් කාර්යසභාවට කලින් ගෙවිය යුතුයි. ගාස්තුව ගෙවූ බවට සාක්ෂියක් වශයෙන් කාර්යාලයෙන් ලබා ගත් කුවිතාන්සියක් නැතුව සතකු මැරීමට ඉඩ නොදිය යුතුයි.

| | |
|---|---|
| හරකුන් සඳහා එකකුට ... ... | රු. 2.50 |
| බැටලුවන්, එලුවන් හෝ ඌරන් සඳහා එකකුට ... | රු. 1.00 |

(2) මිනිසුන්ගේ ආහාරය පිණිස මරනු ලැබීමට සුදුසු යයි 2 වැනි නියෝගය යටතේ සතකු අනුමත කර තිබෙන විට ඒ සතා මස් මඩුවට ඇතුල් කිරීමට ප්‍රථමයෙන් ගාස්තුව ගෙවූ බවට සාක්ෂියක් වශයෙන් කාර්යසභා කාර්යාලයෙන් ලබාගත් කුවිතාන්සියක් පෙන්වා සිටීම උවමනා නොකෙරෙයි.

12. සතුන් මරන ස්ථානය භාර අය විසින් සතුන් මරන ස්ථානයට ගෙන එන ලද සියලුම හරකුන්ගේ රෙජිස්ටරයක් මේ සමඟ තිබෙන ෆෝර්මයෙහි පරිදි තබා ගත යුතුයි.

| හරක් කුවිතාන්සියේ අංක. | විස්තරය | පාට | වයස | හංනිවරන | | මස් මරන්නාගේ නම | හරක් කොටුවට ඇතුල් කළ වේලාව සහ දිනය. | පරීක්ෂාකර බැලූ දිනය | ගෙන ගිය දිනය | වැඩිපුර කරුණු | හරක් බාර ගත්තා නිලධාරී තැනැත්තාගේ කෙටි අත්සන |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | දකුණු පැත්ත | වම පැත්ත | | | | | | |
| | | | | | | | | | | | |

13. මේ නියෝග වල—

"ප්‍රධාන තුමා" යනුවෙන් කාර්ය සභාවේ ප්‍රධාන තුමා අදහස් කරනු ලැබේ.

"ගම්කාර්ය සභාව" යනුවෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැල්ලව ගම්ප්‍රදේශයේ ගම්කාර්ය සභාව අදහස් කරනු ලැබේ.

"සෞඛ්‍ය පිළිබඳ දෛද්‍ය නිලධාරි තුමා" යනුවෙන් කුරුණෑගල සෞඛ්‍ය පිළිබඳ වෛද්‍ය නිලධාරි තුමා අදහස් කරනු ලැබේ.

"ආඥපණත" යනුවෙන් (මස් පිණිස) සතුන් මැරීමේ ආඥ පණත 201 වැනි පරිච්ඡේදය) අදහස් කරනු ලැබේ.

---

## ගම්සභා ආඥපණත—198 වැනි පරිච්ඡේදය

### හාරිස්පත්තුවේ කුළුගම්මනසියපත්තුව ගම්ප්‍රදේශයේ ගම්කාර්ය සභාව

මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තුවේ කුළුගම්මනසියපත්තුව ගම්ප්‍රදේශයේ ගම්කාර්යසභාව විසින් පහත සඳහන් යෝජනාව සම්මත කරගත් බව මහජනයා වෙත මෙයින් දනුම් දෙනු ලැබේ.

ඇල්. ජිනදස,
ගම්සභාපති.

ගම්සභා කාර්යාලය,
කුළුගම්මනසියපත්තුව,
වැරැල්ලගම, 15–12–58.

### යෝජනාව

"වර්ෂ 1954ක්වූ පෙබරවාරි මස 12 වෙනි දින අංක 10,640 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ හතරවෙනි කාණ්ඩයේ ප්‍රසිද්ධ කර වලංගුවට පමුණුවා ඇති මෙම කුළුගම්මනසියපත්තුව ගම්කාර්යසභාවේ යෝජනාව අනුව : වර්ෂ 1953ක්වූ අප්‍රේල් මස 10 වෙනි දින දරණ අංක 10,517 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කර ඇති ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 4 වැනි කාණ්ඩයේ 1 වැනි ඡේදය අනුව මෙහි පහත සඳහන් කර ඇති පාරවල් සහ අඩිපාරවල් වල ඉදිරියෙන් සඳහන්කර ඇති නියම දිග සහ පළලේ ප්‍රමාණය අනුව, එකී පාරවල් සෑදීම සහ ප්‍රතිසංස්කරණය කිරීම මෙම කාර්ය සභාව විසින් කරණු ලැබේ.

| චන්ද කොට්ඨාශයේ නම සහ අංකය | පාරේ සහ අඩිපාරේ නම | දිග හැතැක්ම | දිග දම්වැල් | පළල අඩි |
|---|---|---|---|---|
| 1. හපුගොඩ ... | 1. දෙකිඳ අඹතැන්න පාර ... ... ... | 1 | 22 | 9 |
| 2. උඩබොකළවල ... | 2. පට්ටියාවත්ත–දෙවකිඳ සහනදයක පාර ... ... | 1 | 0 | 18 |
| 3. පල්ලේබොකළවල | 3. කැන්දගහයටලියද්ද–වැලිපැල පාර ... ... | 0 | 3 | 9 |
| 4. රණවන ... | 4. පුස්සේමුදුන–හපුගොඩ වෙල පාර ... ... | 0 | 15 | 9 |
| | 5. පට්ටියාවත්ත–දෙකිඳ අඹතැන්න පාර ... ... | 1 | 45 | 9 |
| | 6. රණවන-දෙවට පාර ... ... ... | 0 | 45 | 9 |
| | 7. හපුගොඩ රජමහ විහාර-පන්සල පාර ... ... | 0 | 49 | 9 |
| | 8. පල්ලේබොකළවල ඇම්බලන් කොටුව පාර ... ... | 0 | 8 | 9 |
| 5. උඩුවාවල ... | 1. උඩුවාවල–හීනාගම පාර ... ... ... | 0 | 35 | 9 |
| 6. යටිවාවල ... | 2. උඩුවාවල කරත්තපාරේ සිට නැවතත් කරත්ත පාරට වැටෙන පාර ... | 0 | 56 | 9 |
| | 3. කොටපොල කුඹුර–පොල්වත්ත පාර ... ... | 0 | 53 | 9 |
| | 4. කොටපොල කුඹුර–කුරුවේගෙදර වත්ත පාර ... ... | 0 | 56 | 9 |
| | 5. රණවන–යටිවාවල පාර ... ... ... | 0 | 67 | 9 |
| | 6. යටිවාවල–කොණ්ඩ දෙණිය පාර ... ... ... | 0 | 26 | 9 |
| | 7. ඇඹටමුරංගාගොඩ–කොලනි පාර ... ... | 0 | 22 | 9 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 7. | ඉඹිගල | 1. | ඉඹිගල-යටිවාවල පාර | 0 | 16 | 9 |
| 8. | කොණ්ඩදෙණිය | 2. | හකුරු අඹේ පාර... | 0 | 40 | 9 |
| | | 3. | පල්කුඹුර-කටුගස්තොට පාර | 1 | 4 | 9 |
| | | 4. | කොණ්ඩදෙණිය-හල්ලොළුව පාර | 0 | 34 | 9 |
| | | 5. | අංගස්තලාව පාර | 0 | 13 | 9 |
| | | 6. | හුරිගහමුදුන-දෙඩම්ගහ මුදුන පාර | 0 | 32 | 9 |
| | | 7. | ඉඹිගල-උගුරැස්සපිටිය සහනදායක පාර | 1 | 63 | 18 |
| 9. | හීනාගම | 1. | පොල්ගස්දෙණිය-උඩුවාවල පාර | 0 | 39 | 9 |
| | | 2. | හීනාගම-කොණ්ඩදෙණිය පාර | 1 | 62 | 9 |
| | | 3. | පුස්සේකුඹුර-නිකතැන්න පාර | 0 | 22 | 9 |
| | | 4. | කුරුණෑගල් පාර-හීනාගම පාර | 0 | 22 | 12 |
| | | 5. | කොරවක්කාව-නිකතැන්න පාර | 0 | 10 | 9 |
| | | 6. | පොල්ගස්දෙණිය-කුළුගම්මන සහනදායක පාර | 1 | 58 | 18 |
| 10. | උගුරැස්සපිටිය | 1. | උගුරැස්සපිටිය-දූල්වල පාර | 0 | 8 | 9 |
| | | 2. | උගුරැස්සපිටිය-දඩොහෝගම මායිම පාර | 0 | 16 | 9 |
| | | 3. | උගුරැස්සපිටිය-හමංගොඩ මායිම පාර | 0 | 5 | 9 |
| | | 4. | උගුරැස්සපිටිය-මගුරුගල පාර | 0 | 36 | 9 |
| | | 5. | උගුරැස්සපිටිය-රනකෙටුගල පාර | 0 | 48 | 9 |
| | | 6. | උගුරැස්සපිටිය-කුළුගම්මන මායිම පාර | 0 | 31 | 9 |
| | | 7. | උගුරැස්සපිටිය-රනකෙටුගල සහනදායක පාර | 0 | 60 | 18 |
| 11. | ගොහාගොඩ | 1. | ඔලිඅංග-කින්දරම් මෝදර පාර | 0 | 39 | 9 |
| | | 2. | තැන්නේවත්ත-සියඹලා අත්තපාර | 0 | 33 | 9 |
| | | 3. | කරත්තපාර-සියඹලා අත්ත පාර | 0 | 58 | 9 |
| | | 4. | පල්ලේමුල්ල-කැටපිටැල්ල පාර | 1 | 0 | 9 |
| | | 5. | නිතුලගහමුදුන-හෙට්ටිවත්ත පාර | 0 | 19 | 9 |
| | | 6. | පල්ලේමුල්ල-බාස්වත්ත පාර | 1 | 6 | 9 |
| | | 7. | බෝගහවෙල-යකාවෙල පාර | 0 | 29 | 9 |
| | | 8. | තැන්නේවත්ත-කැටපිටැල්ල් පාර | 0 | 25 | 9 |
| 12. | හල්ලොළුව උඩගම | 1. | අහස්ලියද්ද-පරණකුරුණෑගල් පාර | 0 | 26 | 9 |
| 13. | හල්ලොළුව පල්ලේගම | 2. | හපුකොටේ-රන්කෙටුගල පාර | 0 | 11 | 9 |
| | | 3. | පල්ලේමුල්ල-පරණකුරුණෑගල් පාර | 0 | 46 | 9 |
| | | 4. | නාගහමුල්ල-උගුරැස්සපිටිය පාර | 0 | 44 | 9 |
| | | 5. | අහස්ලියද්ද-තලාව පාර | 0 | 30 | 9 |
| | | 6. | රනකෙටුගල-පරණකුරුණෑගල් පාර | 0 | 40 | 9 |
| | | 7. | ගන්කොටතැන්න-හෙට්ටිවත්ත පාර | 0 | 62 | 9 |
| | | 8. | පුවක්ගහදොරොව්ව-හල්ලොළුව පාසැල පාර | 0 | 18 | 9 |
| | | 9. | බෝගහකන්ද-පල්ලේමුල්ල පාර | 0 | 14 | 9 |
| | | 10. | නාගහමුල්ල-පල්ලේමුල්ල පාර | 0 | 5 | 9 |
| | | 11. | ලියංගස්තැන්න-මගුරුගල් පාර | 0 | 67 | 9 |
| | | 12. | පල්ලේමුල්ල-කැටපිටැල්ල පාර | 0 | 13 | 9 |
| | | 13. | උස්මීය-නාගහමුල්ල පාර | 0 | 52 | 9 |
| | | 14. | ලියංගස්තැන්න-අහස්ලියද්ද වේල්ල පාර | 0 | 4 | 9 |
| | | 15. | අංගස්තලාව-උස්මීය පාර | 0 | 9 | 9 |
| | | 16. | අංගස්තලාව-කැටේලියද්ද පාර | 0 | 3 | 9 |
| | | 17. | අංගස්තලාව සහනදායක පාර | 1 | 6 | 18 |
| 14. | යටිහලගල පල්ලේගම | 1. | හල්ලොළුවාතොට-උඩගම අමුන පාර | 0 | 65 | 9 |
| | | 2. | ස්පාර් මාවත-බන්ඩාර තැන්න පාර | 0 | 12 | 9 |
| | | 3. | බෝගහකන්ද සහනදායක පාර | 0 | 63 | 18 |
| | | 4. | පරණකුරුණෑගල් පාර-බෝගහකන්ද | 0 | 55 | 9 |
| 15. | යටිහලගල උඩගම | 1. | නින්කොට දෙණිය-ගන්නෝරුව පාර | 0 | 58 | 9 |
| | | 2. | පල්ලේගම අමුණ-පැලව පාර | 0 | 63 | 9 |
| | | 3. | හල්ලොළුවාකොට-උඩගම පාර | 0 | 30 | 9 |
| | | 4. | ඊරියගස්දෙණිය කනත්ත නොහොත් දූල්වල පාර | 0 | 14 | 9 |
| | | 5. | ලිමගහ-ඒදණ්ඩ පාර | 0 | 4 | 9 |
| | | 6. | කොට්ටල කන්ද පාර | 0 | 49 | 9 |
| 16. | දූල්වල | 1. | පරණකුරුණෑගල් පාර-උගුරැස්සපිටිය පාර | 0 | 32 | 9 |
| | | 2. | පරණකුරුණෑගල් පාර-යටිහලගල පාර | 0 | 41 | 9 |
| | | 3. | පරණකුරුණෑගල් පාර-කුළුගම්මන පාර | 0 | 28 | 9 |
| 17. | කුළුගම්මන | 1. | කුළුගම්මන-ගල්ඒදණ්ඩ පාර | 0 | 14 | 9 |
| 18. | මාලගම්මන | 2. | මාලගම්මන, දිග්ගල-කුළුගම්මන පාර | 0 | 36 | 9 |
| | | 3. | පරණකුරුණෑගල පාර-වැරැල්ලගම පාර | 0 | 32 | 18 |
| | | 4. | දඩොහෝගම-කුළුගම්මන පාර | 0 | 28 | 9 |
| | | 5. | දඩොහෝගම-වතුවල පාර | 0 | 28 | 9 |
| | | 6. | විහාරගම-දඩොහෝගම පාර | 0 | 57 | 9 |
| | | 7. | මාලගම්මන-කුළුගම්මන පාර | 0 | 74 | 9 |
| | | 8. | මාලගම්මන-උගුරැස්ස පිටිය පාර | 0 | 39 | 9 |
| | | 9. | දඩොහෝගම-වතුවල කිරුවනා අංග පාර | 0 | 12 | 9 |
| | | 10. | උඩගල-උගුරැස්සපිටිය පාර | 0 | 43 | 9 |
| | | 11. | කුළුගම්මන-කුරුඳුගහමඩ සහනදායක පාර | 0 | 22 | 18 |
| 19. | වතුවල | 1. | වතුවල-දඩොහෝගම පාර | 0 | 43 | 9 |
| | | 2. | වතුවල-ඇඹිල්පුරේ සහනදායක පාර | 0 | 40 | 18 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 20. ඇඹුල්පුරේ | 1. | ඇඹුල්පුරේ–තොටපොල ඇල පාර | 0 | 79 | 9 |
| | 2. | සියඹලාගහ–අස්සැද්දුම පාර | 0 | 21 | 9 |
| | 3. | නුගවෙල–දඩොහෝගමවෙල පාර | 0 | 10 | 9 |
| | 4. | නුගවෙල–දඩොහෝගම මායිම පාර | 0 | 32 | 9 |
| | 5. | නුගවෙල–කළුගල්ලේවෙල පාර | 0 | 19 | 9 |
| 21. බරිගම | 1. | කුරුණෑගල් පාර–මීගස්දෙණිය පාර | 0 | 46 | 9 |
| 22. තිත්තපජ්ජල | 2. | වැරැල්ලගම–දික්කුඹුර පාර | 0 | 26 | 9 |
| | 3. | අරළුඇළ–වැරැල්ලගම පාර | 1 | 10 | 9 |
| | 4. | පොකුබරේ–අංකෙළිහීන්න පාර | 0 | 40 | 9 |
| | 5. | පූරිදිවෙල–ලබුදෙණිය පාර | 0 | 22 | 9 |
| | 6. | වැරැල්ලගම–දික්කුඹුර කරත්ත පාර | 1 | 11 | 18 |
| | 7. | බරිගම–යහලතැන්න කරත්ත පාර | 0 | 20 | 18 |
| 23. ගෝනිගොඩ | 1. | බණ්ඩාර අරඹ නොහොතු අස්සැද්දුම පාර | 0 | 17 | 9 |
| 24. උල්ලඩුපිටිය | 2. | කැලියල්දෙණිය–අත්තරගම පාර | 0 | 20 | 9 |
| | 3. | කළුගල්ලේවෙළ–කැලියල්දෙණිය පාර | 0 | 37 | 9 |
| | 4. | ගෝණිගොඩ–බොක්කාවෙල පාර | 0 | 21 | 9 |
| | 5. | වැලිකුඹුර–ගෝනිගොඩ පාර | 0 | 50 | 9 |
| | 6. | ඒදණ්ඩාගස්දෙණිය පාර | 0 | 26 | 9 |
| | 7. | බෙරගම–බලවත්ගොඩ පාර | 0 | 36 | 9 |
| | 8. | පල්කුඹුර–බෙරගම පාර | 0 | 18 | 9 |
| | 9. | හුන්නන්ඔය–විගුහුම්පොල සහනදායක පාර | 1 | 35 | 18 ” |

## විභාග, විභාග ප්‍රතිඵල ආදිය

### පළාත් පාලන සේවයේ පහළ ශ්‍රේණියට අයත් සිංහල ලඝු ලේඛකයන් බඳවා ගැනීමේ විභාගය— 1959 සැප්තැම්බර් 19

**1. විභාග දිනය.**—පළාත් පාලන සේවයේ පහළ ශ්‍රේණියට අයත් මාරුකිරීම් සහිත සිංහල ලඝුලේඛක සේවයට බඳවා ගැනීම පිණිස සිංහල ලඝුලේඛනයෙහි හා ටයිප් ගැසීමේ සමත් ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයේ අයදුම්කරුවන් සඳහා කොළඹ දී 1959යේ සැප්තැම්බර් මස 19 වැනි දින තරඟ විභාගයක් පවත්වනු ලැබේ.

විභාගය පවත්වනු ලබන්නේ විභාග කොමසාරිස්වරයා විසිනි.

2. (i) **වැටුප්.**—සමත්වන අයදුම්කරුවන්, පුරප්පාඩු ඇතිවන පරිදි ගම්කායභා සභා නොවන අන්‍ය පළාත් පාලන ආයතනයන්හි, පහළ ශ්‍රේණියට අයත් සිංහල ලඝුලේඛකයන් ලෙස පත්කරනු ලැබේ. එසේ පත්කරනු ලබන අපේක්ෂකයන්ගේ වාර්ෂික වැටුප රුපියල් 1,740ක් වේ. එය රු. 120 බැගින් වන වාර්ෂික වැඩිවීම් වලින් යුතුව වර්ෂයකට රු. 3,780 තෙක් ඉහළ නගී. මෙම වැටුප් ක්‍රමයෙහි රු. 2,940 වාර්ෂික වැටුපට ප්‍රථම කාර්යක්ෂමතා කඩයිමක් පැවැත්වේ. රජයේ ප්‍රමාණයන්ට හා නියමයන්ට අනුව ගෙවල් කුලී දීමනා, තාවකාලික ජීවන වියදම් දීමනා හා විශේෂ ජීවන වියදම් දීමනා ද ගෙවනු ලැබේ.

(ii) **සේවා කොන්දේසි.**— (අ) පුරුෂ පක්ෂයේ අයදුම්කරුවන්ට මෙම තනතුරු විශ්‍රාම වැටුප් සහිත වන අතර, පළාත් පාලන සේවා වැන්දඹු හා අනාථ දරු විශ්‍රාම වැටුප් ප්‍රයෝජන ලැබීමටද ඔවුනට හිමිකම් ඇත. ස්ත්‍රී පක්ෂයේ අපේක්ෂිකාවන් පත්කරනු ලබන්නේ අර්ථසාධක අරමුදලක් පදනම් කොට ගෙනය. පුරුෂ පක්ෂයේ අයදුම්කරුවන් අවුරුදු 2ක ආධුනික සේවා කාලයක් යටතේ පත්කරනු ලබන අතර ස්ත්‍රී පක්ෂයේ අපේක්ෂිකාවන් පත්කරනු ලබන්නේ අවුරුදු 2ක පරීක්ෂණාත්මක කාලයක් පිටය. ආධුනික සේවා කාල සීමාව ඉකුත්වීමෙන් පසු පුරුෂ පක්ෂයේ අපේක්ෂකයින්ගේ පත්වීම් ස්ථිර කරනු ලබන්නේත්, පරීක්ෂණාත්මක කාල සීමාව ඉකුත්වීමෙන් පසු ස්ත්‍රී පක්ෂයේ අපේක්ෂිකාවන් තවදුරටත් සේවයේ රඳවා ගැනීම කරනු ලබන්නේත් ඔවුන්ගේ වැඩ හා හැසිරීම සතුටුදායක වී, නියම කරනු ලබන ප්‍රායෝගික පරීක්ෂණයක් සහිත කාර්යක්ෂමතා පරීක්ෂණය කින් සමත් වූ විටය. රු. 2,940හේ වාර්ෂික වැටුපට ප්‍රථම කාර්යක්ෂමතා කඩයිමෙන් සමත් කිරීමද, වැඩවල හා හැසිරීමේ සතුටුදායක භාවයත් පරීක්ෂණයකින් සමත්වීමත් යන කරුණු උඩ රඳා පවතී.

(ආ) නිවාඩුදීම හා අනිකුත් සේවා කොන්දේසි, 1945හේ අංක 43 දරන පළාත් පාලන ආඥා පනතේ විධිවිධාන හා ඒ යටතේ සම්පාදිත වෙනත් රෙගුලාසිවලට යටත්වන සේ, පළාත් පාලන බල මණ්ඩලයේ අතුරු ව්‍යවස්ථාවන්ට හා රෙගුලාසි වලට අනුව නිගමනය කෙරෙති.

(ඇ) නාගරික සභා හැරෙන්නට අනිකුත් පළාත් පාලන ආයතනය කට පත්කරනු ලැබූ අයදුම්කරුවන්, ඉහත සඳහන් කරන ලද ආඥා පනතේ දෙවැනි උප ලේඛනයෙහි නියම කොට ඇති *ප්‍රදේශයක් ඇතුළත මාරුකර හැරීමට යටත් වන අතර එසේ නියමිත කොට ඇති ලංකාවේ ප්‍රදේශයන් තුළ ඕනෑම ස්ථානයකට පත්කර යවනු ලැබිය හැකිය. 1946, අංක 5 දරන පළාත් පාලන (සංක්‍රමණ විධිවිධාන) ආඥාපනතින් සංශෝධනය කරන ලද 1945හේ අංක 43 දරන ආඥාපනත පිළිබඳව තවදුරටත් කෙරෙන සංශෝධනවලට හා එම ආඥාපනත යටතේ සම්පාදිත වෙනත් රෙගුලාසි වලටද ඔව්හු යටත් වෙති.

3. සමත්වන අයදුම්කරුවන්ගේ නාමයන්, ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ 4 වැනි කොටසේ පළකරනු ලබන්නේය. පුරප්පාඩු ඇතිවන පරිදි ඔවුන්ට පත්වීම් දෙනු ලැබේ.

4. **සුදුසුකම් :—**

(i) අපේක්ෂකයන් යහපත් චරිතයෙන් යුක්ත විය යුතුය.

(ii) අපේක්ෂකයන් ලාංකිකයන් විය යුතුය. †

(iii) අපේක්ෂකයන් යටත් පිරිසෙයින් :—

(අ) සිංහල විෂයයක් වශයෙන් ගෙන, කේම්බ්‍රිජ් සීනියර්, හෝ ලන්ඩන් මැට්‍රිකියුලේෂන්, හෝ ඉංග්‍රීසි ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ ජ්‍යෙෂ්ඨ ගෘහ විද්‍යා සහතික පත්‍ර විභාගය, හෝ

(ආ) සිංහල ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය ඇත්තවුන් විය යුතුය.

**සංලක්ෂ්‍යය.**—කිසියම් අයදුම්කරුවකු ඉහත සඳහන් විභාග අතුරෙන් කිසිවකට පෙනී සිට ඇති කල මෙම විභාගයට ඉල්ලුම් පත්‍ර බාර ගන්නා අවසාන දවස වනතුරුත් එකී විභාගයේ ප්‍රතිඵල නිකුත්වී නැතිනම් එවැනි අයගේ ඉල්ලුම්පත්‍ර භාරගනු නොලැබේ.

(iv) අපේක්ෂකයින් 1959 සැප්තැම්බර් මස 1 දිනට වයසින් අවුරුදු 17කට නොඅඩුවූත් අවුරුදු 30කට නොවැඩිවූත් අය විය යුතුයි.

(අ) යුද්ධ සේවයේ සිටි අයදුම්කරුවන්ට තමන් පසුගිය යුද්ධයේදී ක්‍රියාකාරී සේවයේ යෙදී සිටි කාලය තම වයසින් අඩුකර ගත හැකිය.

(ආ) අවුරුදු දෙකක හෝ ඊට වැඩි අඛණ්ඩ කාල පරිච්ඡේදයක් තුළ රජයේ සේවයෙහි සිටි හෝ සිටින තාවකාලික ලඝුලේඛකයින්ට එකී සේවා කාලය වයසින් අඩුකර ගත හැකිය. එහෙත් එසේ අඩුකර ගත හැකි වන්නේ තාවකාලික සේවාව 1946 අප්‍රේල් 1 දිනට පසුව වුවහොත්ය.

අයදුම්කරුවෝ යටත් පිරිසෙයින් 1959 අගෝස්තු 1 දිනට එක්කම ඊට පළමු 3 අවුරුදු කාල පරිච්ඡේදයක් තුළ 1945 අංක 43 දරන පළාත් පාලන සේවා ආඥාපනතේ දෙවැනි උපලේඛනයෙහි සඳහන්කොට ඇති ප්‍රදේශයක් තුළ පදිංචිවී සිටිය යුත්තාහ. *

5. **දැනට පළාත් පාලන සේවයේ සාමාජිකයන්ව සිටින අයදුම්කරුවන්ගේ සුදුසුකම්.**

(i) 1959 අගෝස්තු 1 දිනට පළමු සවකීය පත්වීම් ස්ථිර කරනු ලැබ ඇති, පළාත් පාලන සේවයේ යෙදී සිටින ටයිප් ගසන්නන්ට වයස හා අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ නියමයන් නොතකා විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ.

(ii) 1959 අගෝස්තු 1 දින හෝ ඊට පළමු සවකීය පත්වීම් ස්ථිර කරනු ලැබ ඇති, 1959 සැප්තැම්බර් 1 දිනට වයස අවුරුදු 45ට අඩු පළාත් පාලන සේවයේ උප ලිපිකරුවන්ට අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ නියමයන් නොතකා විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ.

(iii) පළාත් පාලන ආයතනයක ස්ථිර සේවයක නියුක්ත, අවුරුදු 2ට අඩු නොවූ සතුටුදායක සේවයක් ඇති අයදුම්කරුවන්ට වයස පිළිබඳ නියමයන් නොතකා විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ. එහෙත් එසේ ඉඩ දෙන්නේ ඉහත 4 (iii) වැනි ඡේදයේ (අ) සහ (ආ) අංකවල සඳහන් අධ්‍යාපන සුදුසුකම් ඇත්නම් පමණි.

6. **අයදුම්පත්‍ර .**—(i) විභාගයට ඇතුළත් වීමේ අයදුම්පත්‍ර කොළඹ කොටුවේ, ගෆ්පුර් ගොඩනැගිල්ලේ පළමුවන තට්ටුවේ අංක 20 1/5 දරන කාමරයේ පිහිටි පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාල යෙන් 1959 අගෝස්තු 26 වැනි දින දක්වා ලබාගත හැක. එසේ ලබා ගත් අයදුම්පත් නියම ලෙස සම්පූර්ණකොට 1959 අගෝස්තු 28 දින හෝ ඊට ප්‍රථම, "පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති තුමා, තැ. පෙ. 530, කොළඹ 1" යන ලිපිනයට එවිය යුතුයි. 1959 අගෝස්තු 28 දිනට පසු ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සැලකිය යුතුයි.—විභාගයට ඇතුළත් වීමේ අයදුම්පත් තැපැල් මගින් ඉල්ලා සිටින අපේක්ෂකයින් ස්වකීය ලිපිනය ලියූ ලියුම් කවරයකුත් සමග එසේ කළ යුතුයි. එසේ නොමැතිව තැපැල් පත් හා ලියුම් පමණක් එවා අයදුම්පත් ඉල්ලා සිටින අයදුම් කරුවන්ට ඒවා නොලැබෙනවා ඇත.**

(ii) දැනට ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවල හෝ පළාත් පාලන බලමණ්ඩලවල සේවයේ නියුක්ත අයදුම්කරුවන්, තම තනතුරු ස්ථිර වේවා, තාවකාලික වේවා, සිය අයදුම්පත්‍ර එවිය යුත්තේ, තමන් දැනට සේවය කරන දෙපාර්තමේන්තුවල ප්‍රධානීන්, පළාත් පාලන බල මණ්ඩලයේ සභාපතිවරයා/කොමසාරිස්වරයා/විශේෂ කොමසාරිස් වරයා මාර්ගයෙනි. මෙසේ කිරීමට යම් අයදුම්කරුවකු අපොහොසත් වුවහොත් ඔහු විභාගයට නුසුදුස්සකු ලෙස සලකනු ලැබේ.

(iii) අයදුම්පත්‍රවල රු. 5ක වටිනාකම ඇති මුද්දර අලවා යථා පරිදි අවලංගු කොට තිබිය යුතුය.

**සංලක්ෂ්‍යය.**—අයදුම් පත්‍රයට වෙනත් ලියවිලි හෝ ලියවිලිවල පිට පත් අමුනා නොතිබිය යුතුය. එහෙත් ඉහත 4 (iv) ඡේදයේ සඳහන් පරිදි තමන් 1945 අංක 43 දරන පළාත් පාලන සේවා ආඥාපනතේ දෙවැනි උප ලේඛනයෙහි සඳහන් කොට ඇති ප්‍රදේශයක 1959 අගෝස්තු 1 දිනට ප්‍රථම යටත් පිරිසෙයින් අවුරුදු 3ක කාලයක් පදිංචිකරුවකු බවට දිස්ත්‍රික්ක ආදායම් නිලධාරියකුගෙන්, සමාදාන විනිශ්චයකාරයෙකුගෙන්, අධි නීතිඥයකුගෙන්, නීතිඥයකුගෙන්, හෝ ප්‍රසිද්ධ නිලධාරියකු ගෙන් හෝ ලබාගත් සහතිකයක් ඉල්ලුම් පත්‍රයට අමුනා තිබිය යුතුයි.

(අ) නියමිත ආකෘති පත්‍රයෙහි නොලියන ලද අයදුම්පත්‍ර බාරගනු නොලැබේ.

(ආ) මෙම විභාගයේ නීතිරීතිවලට පටහැනිව ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් බාරගනු නොලැබේ.

(i) පිළිගනු ලැබූ අයදුම්පත්‍ර හිමි අයදුම්කරුවන්ට පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපතිතුමා ප්‍රවේශපත්‍ර නිකුත් කරයි. විභාගයට පෙනී සිටින අයදුම්කරුවෝ ස්වකීය ප්‍රවේශපත්‍ර විභාගය පරි පාලනය සඳහා පත්කරනු ලැබ සිටින නිලධාරියාට ඉදිරිපත් කළ යුතුයි. එසේ ප්‍රවේශපත්‍ර ඉදිරිපත් නොකරන අයදුම්කරුවන් විභාග යට පෙනී සිටීම ප්‍රතික්ෂේප කරනු ඇත.

අයදුම්කරුවෝ තමනට නියමිත විභාග ශාලාවෙහි විභාගයට පෙනී සිටිය යුතුය. තමාට නියම කොට ඇති විභාග ශාලාව හැරෙන්නට වෙනත් එකක විභාගයට පෙනී සිටීම සඳහා ඉදිරිපත්වන අයදුම් කරුවන්ට විභාගයට පෙනී සිටීමට අවසර නොදෙනු ඇත.

ප්‍රවේශපත්‍රයත් සමග කාල සටහන් පිටපතක් හා අයදුම්කරුවන්ට මග පෙන්වීම සඳහා ව්‍යවස්ථා මාලාවක් ද එවනු ලැබේ. අයදුම්කරුවෝ මේ ව්‍යවස්ථා සුපරීක්ෂාකාරී ලෙස කියවිය යුත්තාහ. විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවෙක්ම විභාග දිනයෙහිදී ස්වකීය ප්‍රවේශපත්‍රය විභාග ශාලාව භාර නිලධාරියාට භාරදිය යුතුයි.

විභාග දිනයට යටත් පිරිසෙයින් දින 7 වත් පළමු ස්වකීය ප්‍රවේශ පත්‍රය නොලැබුණහොත් පහත සඳහන් විස්තර සපයමින් තමාට ප්‍රවේශ පත්‍රය නොලැබුණු බව පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපතිතුමා වෙත අප්‍රමාදව දන්වා එවිය යුතුයි.

1. විභාගයේ නම :————.

2. සම්පූර්ණ නම :————.

3. සම්පූර්ණ තැපැල් ලිපිනය :————.

4. අයදුම්කරු විභාගයට පෙනී සිටීමට ඉල්ලා සිටි විභාග ශාලාව :————.

7. අයදුම්කරුවන් විසින් තමා දැනුවත්වම සපයා ඇති තොරතුරු කිසිවක් අසත්‍ය බව අනාවරණය වුවහොත්, ඔවුන් පත්කරනු ලැබ සිටිනම්, සේවයෙන් පහකළ හැකිය. අදාළ කාරණයක් වුවමණාවෙන් වසන් කිරීම ගැනද ඒ ආකාරයෙන්ම දඬුවම් පමුණුවනු ලැබේ.

8. **ඉල්ලා අස්කර ගැනීම් හා ආපසු ගෙවීම්.**—කිසිම කාරණයක් හේතුකොටගෙන මුද්දර ගාස්තුව ආපසු නොගෙවනු ලැබේ.

9. **විභාගයට යාම සඳහා නිලධාරීන්ට නිවාඩු දීම.**—ස්වකීය දෙපාර්ත මේන්තුවල හෝ පළාත් පාලන බල මණ්ඩලවල සේවය කරන, පිළිගන්නා ලද අයදුම්පත්‍ර හිමි නිලධාරීන්ට විභාගයට පෙනී සිටීම සඳහා රාජකාරි නිවාඩු දෙන ලෙස දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගෙන් හා, පළාත් පාලන බල මණ්ඩල සභාපතිවරුන්ගෙන්, විශේෂ කොම සාරිස්වරුන්ගෙන් හා කොමසාරිස්වරුන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

10. **හඳුනාගැනීමේ පත්.**—තමා පෙනී සිටින එක් එක් විෂයයක් පාසා විභාග ශාලාව භාර නිලධාරියාට අයදුම්කරු තමා බව ඒත්තු ගැන්විය යුතුයි. මේ කාරණය සඳහා පහත සඳහන් ලියවිලි වලින් එකක් පිළිගනු ලැබේ ;—

(අ) තැපැල්පතිතුමා විසින් නිකුත් කරනු ලබන හඳුනා ගැනීමේ පත.

(ආ) මේ විභාගයේ දිනයට කලින් අවුරුදු 3ක කාල සීමාවක් ඇතුළතදී නිකුත් කරන ලද වලංගු පාස්පෝට් පත්‍රයක්.

(ඇ) මේ විභාගයේ දිනයට කලින් අවුරුදු 3ක කාල සීමාව ඇතු ළත ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් මගින් නිකුත් කරන ලද අයිතිකරුගේ ඡායා රූපයක් සහිත ඕනෑම සහතිකයක් හෝ, බලපත්‍රයක් හෝ වෙනත් ලියවිල්ලක්.

ප්‍රවේශපත්‍රයත් සමග ඉහත සඳහන් ලියවිලි වලින් එකක් ඉදිරි පත් කිරීමට අපොහොසත් වන කිසිම අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට ඉඩ නොදෙනු ලැබේ.

11. **විෂයයෝ.**—විභාගයට අයත් විෂයයන් හා එක් එක් විෂයට නියමිත ලකුණු මෙසේ ය :—

(අ) සිංහල භාෂාව හා රචනය—(වාක්‍ය රචනයක්, සාරාංශයක් හා භාෂාවේ නිවැරදි භාවිතය හා අවබෝධය පරීක්ෂා කිරීම සඳහා ප්‍රශ්නත් ඇතුළු පැ. 2ක ප්‍රශ්න පත්‍රයකි). ලකුණු—100.

(ආ) සිංහල ලඝුලේඛනය—මිනිත්තුවකට වචන 60ක වේගයකින් කියවන වාක්‍ය කොටස් මිනිත්තු 5ක් තුළ ලඝුලේඛන යෙන් ලියාගැනීම හා ඒ සටහන් මිනිත්තුවකට වචන 5 බැගින් දීර්ඝ ලේඛනයට හරවා ලිවීම. ලකුණු—300.

(ඇ) සිංහල ටයිප් ගැසීම—වචන 400ක පමණ වාක්‍ය කොටසක් මිනිත්තු 20ක් තුළ නිවැරදිව. ටයිප් කිරීම. මිනිත්තුවට වචන 20 බැගිනි. ලකුණු—100.

(ඈ) සම්මුඛ පරීක්ෂණය—මේ විභාගයට පෙනී සිටීම සඳහා අයදුම් කරුවන් සුදුසුකම් ඇත්තන් බවට පත්කරන, ඔවුන් සමත් වී ඇති විභාගයන්හි සහතිකවල මුල් පිටපත් ලිපි හා උප්පැන්න සහතිකය සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුයි. ලකුණු—100.

12. විභාගය කොටස් දෙකකින් යුක්තය. ලිඛිත පරීක්ෂණය පළමු වෙන් පැවැත්වේ. එහි ප්‍රතිඵල අනුව සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම් කරුවෝ තරගාකාරයෙන් තෝරනු ලැබෙති. සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අයදුම්කරුවන් ගණන නිශ්චය කරනු ලබන්නේ පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසිනි. සියලුම ලිඛිත පත්වල නරක අත් අකුරු හා අක්ෂර වින්‍යාසයේ වැරදි පිළිබඳව ලකුණු අඩු කරනු ලැබේ. කියවිය නොහැකි අත් අකුරු ඇති අයදුම්කරුවන් නුසුදුස්සන් කළ හැක. සම්මුඛ පරීක්ෂණය කොළඹ දී පැවැත්වේ.

13. **වෛද්‍ය පරීක්ෂණය.**—සමත්වන අයදුම්කරුවෝ දිවයිනේ ඕනෑම කොටසක සේවය කිරීම සඳහා ශාරීරික වශයෙන් යෝග්‍ය බව සනාථ කිරීමේ වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුය.

ඊ. ඇෆ්. ඩයස් අබේසිංහ,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ
සභාපති.

තැ. පෙ. 530,
1959 අගෝස්තු මස 10 වැනි දින,
කොළඹ දීය.

සැ. යු.—විභාගය පිළිබඳ කිසිම ලිපියක් සභාපතිවරයාගේ පෞද් ගලික නමට නොඑවිය යුතුයි.

පළාත් පාලන සේවයට බඳවා ගැනීම පිළිබඳ සෑම කරුණක් සඳහාම "ලාංකික" යන පදයෙන් අදහස් කරන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් හෝ ලංකාවේ පුරවැසි බව ලබා ඇති තැනැත්තන් ය.

1945 අංක 43 දරන පළාත් පාලන සේවා ආඥාපනතේ දෙවැනි උප ලේඛනයෙහි නියමිත ප්‍රදේශ තුන පහත සඳහන් පිළිවෙල අනුව වේ.

"ඒ" **ප්‍රදේශය.**—කොළඹ, කළුතර, ගාල්ල, මාතර, හම්බන්තොට සහ හලාවත යන ආදායම් දිස්ත්‍රික්ක.

"බී" **ප්‍රදේශය.**—උතුරු මැද පළාත, ඌව පළාත; මහනුවර, මාතලේ, නුවර එළිය, රත්නපුර, කෑගල්ල සහ කුරුණෑගල යන ආදායම් දිස්ත්‍රික්ක, පුත්තලම් ආදායම් දිස්ත්‍රික්කයේ දෙමළ හත්පත්තුව, වවුනියා ආදායම් දිස්ත්‍රික්කයේ දකුණු වවුනියා (සිංහල කොටස) මඩ කලපු ආදායම් දිස්ත්‍රික්කයේ බින්තැන්න පත්තුව හා වැවගම් පත්තුව.

"සී" **ප්‍රදේශය.**—යාපනය, මන්නාරම සහ ත්‍රිකුණාමලය යන ආදායම් දිස්ත්‍රික්ක, දෙමළ හත්පත්තුව හැර පුත්තලම් ආදා යම් දිස්ත්‍රික්කය දකුණු වවුනියා සිංහල කොටස හැර වවුනියා ආදායම් දිස්ත්‍රික්කය හා බින්තැන්න සහ වැවගම් පත්තු හැර මඩකලපු දිස්ත්‍රික්කයේ ඉතුරු කොටස.

ඒ ඒ ප්‍රදේශයන්හි පදිංචි බව සහතික කිරීමේ ආකෘති පත්‍රය :—

........................................මහතා/මහත්මී ලංකාවේ පුරවැසි යකු බවත් ඔහු/ඈ 1959 අගෝස්තු 1 දිනට ප්‍රථම අවුරුදු 3කට අඩු නොවූ කාලයක් ........................................ පදිංචිව සිටි බවත් සහතික කරමි.

ආදායම් පාලක නිලධාරි/සමාදාන විනිශ්චයකරු/
අධිනීතිඥ/නීතිඥ/ප්‍රසිද්ධ නොතාරිස්.

# අතුරු ව්‍යවස්ථා

ජී. බී. 14/12/1

## ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ ගාලු දිස්ත්‍රික්කයේ නාගොඩ ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව විසින් සම්පාදිතව, 1947 සැප්තැම්බර මස 24 දින අංක 9,773 දරණ "ගැසට්" අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිතවූ එකී වගන්තියෙන් පලාත් පාලන හා නිවාස කටයුතු පිළිබඳ අමාත්‍ය තුමිය කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමිය විසින් අනුමතකරනලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පලාත් පාලන හා නිවාස කටයුතු පිළිබඳ අමාත්‍ය කාර්‍යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1959 ජූලි මස 27 වැනි දින,
කොළඹදීය.

### අතුරු ව්‍යවස්ථා

1940 සැප්තැම්බර් 6 දින අංක 8,659 දරණ ගැසට් පත්‍රයේ පළවූ රථවාහන හා සතුන් පිළිබඳ බද්ද සම්බන්ධයෙන්වූ අතුරු ව්‍යවස්ථා වලට යාකොට ඇති උපලේඛණය අස්කර ඒ වෙනුවට මෙහි පහත සඳහන් උපලේඛණය යෙදීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

උපලේඛනය

| | | |
|---|---|---|
| සෑම ගොන් දෙන්නා බඳින කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා | ... ... | නා. බ. ක. |
| තනි ගොනා බඳින සෑම කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා | ... ... | නා. ත. ක. |
| සෑම ජින් රික්ෂෝ කරත්තයක් සඳහා | ... | නා. ඊ. ක. |
| සෑම අත් කරත්තයක් සඳහා ... | ... | නා. අ. ක. |
| සෑම බයිසිකලයක් සඳහා | ... ... | නා. ග. බ. |

---

ජී. බී. 14/31/9

## ගම්සභා ආඥාපණත

ගම්සභා ආඥාපණතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ මාතර දිස්ත්‍රික්කයේ අකුරැස්ස ගම්ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව විසින් සම්පාදිතව, 1947 සැප්තැම්බර මස 24 වැනි දින අංක 9,773 දරණ "ගැසට්" අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිතවූ එකී වගන්තියේ (3) වැනි උප වගන්තියෙන් පළාත් පාලන හා නිවාස කටයුතු පිළිබඳ ඇමතිතුමිය කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමිය විසින් අනුමත කරනලද අතුරු ව්‍යවස්ථාවයි.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන හා නිවාස කටයුතු පිළිබඳ අමාත්‍ය කාර්‍යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1959 ජූලි 27 දින,
කොළඹදීය.

### අතුරු ව්‍යවස්ථා

කාර්‍ය සභාව විසින් සම්මත කරගන්නාලද පොදු ආදශී අතුරු ව්‍යවස්ථාවල XII වැනි කාණ්ඩයේ ඇති අතුරු ව්‍යවස්ථාවල 2 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරනලද සෑම බලපත්‍රයක්ම, එකී අතුරු ව්‍යවස්ථා යටතේ කලින් අවලංගු කරන ලද්දේ නම් මිස නැති නම්, එකී බලපත්‍රය නිකුත් කරනලද අවුරුද්දේ දෙසැම්බර් මස 31 වැනි දයින් එය අවසන් වන්නේය.

2. කාර්‍ය සභාව විසින් සම්මත කරගන්නා ලද අතුරු ව්‍යවස්ථාවල X, XI XII, XIII, XVIII හා XXII, වැනි කාණ්ඩවල ඇති අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් සඳහාවූ සෑම ඉල්ලුම් පත්‍රයක්ම, කාර්‍ය සභාව විසින් සපයා ඇති ආකෘති පත්‍රයේ ප්‍රකාරයට සකස් විය යුතුවාත් හැර, :—

(අ) එකී ඉල්ලුම් පත්‍රය අළුත් බලපත්‍රයක් සඳහා නම්, එම බල පත්‍රය අවශ්‍ය ව්‍යාපාරයට පටන් ගැනීමේ දිනට නො අඩු තිස් දිනකට කලින් හා,

(ආ) එකී ඉල්ලුම් පත්‍රය දැනට තිබෙන බලපත්‍රයක් අළුත් කිරීම සම්බන්ධයෙන් නම්, එම අළුත් කිරීම අවශ්‍ය අවුරුද්දට කලින් අවුරුද්දේ සැප්තැම්බර් මාසයේ පහළොස් වැනි දිනට හෝ ඊට මත්තෙන් ද, සභාපතිතුමා වෙත ලැබෙන්ට සැළැස්විය යුතු වන්නේ ය.

3. මේ අතුරු ව්‍යවස්ථාවල, "සභාපතිතුමා" යනුවෙන් කාර්‍ය සභාවේ සභාපති තුමා අදහස් කරනු ලැබේ. "කාර්‍ය සභාව" යනුවෙන් මාතර දිස්ත්‍රික්කයේ අකුරැස්ස ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව අදහස් කරනු ලැබේ.

---

ඇල්. ජී. ඩී.—14/20.

## සුසානභූමි හා භූමදාන කිරීම පිළිබඳ ආඥා පනත

හමංගල්ල ගම්ප්‍රදේශයේ පාලන බල සීමා ඇතුළත පිහිටි සුසාන භූමි සඳහා ගම්සභා ආඥාපනතේ (198 වෙනි පරිච්ඡේදයේ) 51 වෙනි වගන්තිය සම්බන්ධකොට ගත් සුසානභූමි හා භූමදාන කිරීම පිළිබඳ ආඥාපනතේ (181 වැනි පරිච්ඡේදයේ) 38 වෙනි වගන්තිය යටතේ විධි වූ බලමණ්ඩලය විසින් එනම් හමංගල්ල ගම්කාර්‍ය සභාව විසින් සම්පාදිතව 1947 සැප්තැම්බර් 24 වෙනි දින අංක, 9,773 දරණ ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිත වූ සුසානභූමි හා භූමදාන කිරීම පිළිබඳ ආඥාපනතේ 39 වෙනි වගන්තියෙන් පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ ඇමතිවරිය කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමිය විසින් ස්ථිර කරන ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන හා නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම්තැන.

1959 ජූලි 30 වැනිදින,
කොළඹදීය.

### අතුරු ව්‍යවස්ථා

1. මේ අතුරු ව්‍යවස්ථා යටතේ ලියා පදිංචි කරනු ලබන සියලුම සුසානභූමි පිළිබඳ ලේඛණයක් කාර්‍ය සභාව විසින් තීරණය කරනු ලබන යම් පෝරමයක ප්‍රකාරයට ප්‍රධානතුමා විසින් කාර්‍යසභා කාර්‍යාලයේ තබා ගතයුතුයි.

2. (i) මේ අතුරු ව්‍යවස්ථා "ගැසට්පත්‍රයේ" පළකරන ලද දිනයේදී ගම්ප්‍රදේශය ඇතුළත පිහිටා තිබෙන සෑම සුසානභූමියකම අයිතිකාරයා විසින් එකී දින සිට මාස එකක් ඇතුළත දී එකී සුසාන භූමිය ලියා පදිංචි කරන මෙන් ඉල්ලා සිටිය යුතුයි.

(ii) මෙම අතුරු ව්‍යවස්ථා ගැසට් පත්‍රයේ පළකරවනු ලැබීමෙන් පසුව කිසියම් දිනෙක හමන්ගල්ල ගම් ප්‍රදේශය ඇතුළත පිහිටුවනු ලද සෑම සුසාන භූමියකම අයිතිකාරයා විසින් එකී දින සිට මාසයක් ඇතුළතදී එකී සුසාන භූමිය ලියා පදිංචිකර සිටින ලෙස ඉල්ලා සිටිය යුතුය.

(iii) සුසානභූමියක් ලියාපදිංචි කිරීම සඳහා වූ සෑම ඉල්ලුම්පත්‍රයක්ම ලියවිල්ලකින් වියයුතුවාත් හැර එය අයිතිකාරයා විසින් අත්සන් කරනු ලැබ ප්‍රධානතුමා නමට එවිය යුතුද වන්නේ ය.

3. සුසානභූමියක අයිතිකාරයා විසින් එය වටේට තාප්පයක් හෝ වැටක් බැඳ ඒ වැට හෝ තාප්පය මනා තත්වයකට තබා ගතයුතුයි.

4. කිසිම මිණීවලක් ගැඹුරෙන් අඩි හතරහමාරකට අඩුව හෝ වෙනත් මිණීවලක සිට දුරින් අඩි තුනකට අඩුව හෝ කැපියයුතු නැත.

5. මෘතශරීර භූමදාන කිරීමෙන් පසුව එය නැවත ගොඩ ගැනීමට නියමකිරීමට තරම් බලයක් ඇති අධිකාරී මණ්ඩලයක නියමයන් පිට මිස නැත්නම් කිසිවකු විසින් යම් මෘතශරීරයක් භූමදාන කොට අවුරුදු තුනක් ගතවීමට පෙර එය වළලන ලද වල නැවත විවෘත නොකළ යුතුයි.

6. (i) ප්‍රධානතුමා විසින් ඒ සඳහා නිකුත් කරන ලද අවසරපත්‍රයක බලය පිට මිස නැත්නම් කිසිවකු විසින් කිසිම සුසානභූමියක කිසිම ස්මාරකයක් සෑදීම හෝ සෑදීමට සැලැස්සීම හෝ නොකළ යුතුයි.

(ii) යම්කිසි ස්මාරකයක් සෑදීම සඳහා ඉඩදෙනු ලබන ප්‍රදේශය හතරැස් අඩි හතරකට වැඩි නොවිය යුතුයි.

(iii) 1 වෙනි ඡේදය යටතේ නිකුත්කරන ලද සෑම අවසරපත්‍රයකම ඊට අදාල ස්මාරකය සෑදීම සම්බන්ධයෙන් ඉඩදෙන ලද බිම්ප්‍රමාණය මෙතෙකැයි සඳහන්කර තිබිය යුතුයි.

7. මේ අතුරු ව්‍යවස්ථාවල—

"ප්‍රධානතුමා" යනුවෙන් කාර්‍ය සභාවේ ප්‍රධානතුමා අදහස් කරනු ලැබේ.

"කාර්‍ය සභාව" යනුවෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ හමංගල්ල ගම්ප්‍රදේශයේ ගම්කාර්‍යසභාව අදහස් කරනු ලැබේ.

"අයිතිකාරයා" යනුවෙන් සුසානභූමියක භාරකාරයා, පාලකයා අයිතිකාරයා හෝ සුසානභූමියක අයිතිවාසිකම් දක්වීමට හිමිකම් ඇති වෙනත්, අයකු හෝ අදහස් කරනු ලැබේ.

ඇල්. ජී. ඕ. ජීසී.14/39.

### ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥා පණතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ හලාවත දිස්ත්‍රික්කයේ යටකලම්පත්තු ගම් ප්‍රදේශයේ ගම්කාරක සභාව විසින් සම්පාදිතව, 1947 සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරණ "ගැසට්" අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිතවූ එකී වගන්තියෙන් පළාත් පාලන හා නිවාස කටයුතු පිළිබඳ ඇමතිතුමිය කෙරෙහි පැවරීතිබෙන බලයේ ප්‍රකාර එතුමිය විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1959 අගෝස්තු 5 වැනි දින,
කොළඹ දීය.

#### අතුරු ව්‍යවස්ථාව

වර්ෂ 1956 සැප්තැම්බර් මස 7 වැනි දින අංක 10,968 දරණ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනලද අප්‍රසන්නවූ හා අන්තරාදායකවූ කර්මාන්ත පිළිබඳ අතුරුව්‍යවස්ථාව මෙහි පහත සඳහන් ප්‍රකාර සංශෝධනය කරනු ලැබේ.

1. එහි 1 වැනි ඡේදයේ සඳහන් "සෝඩා, ලැමනඩ් ආදී සිසිල් බීම වර්ග සෑදීම" යන කාරණය එක්කම ඊළඟට මෙහි පහත සඳහන් අළුත් කාරණා යෙදීමෙනි. එනම් :—

"ගෘහ භාණ්ඩ සෑදීම
ගෘහ භාණ්ඩ ගබඩා කිරීම
ගෝනි ගබඩා කිරීම
වේවැල් බඩු සෑදීම හෝ ගබඩා කිරීම
හිස් බෝතල් ගබඩා කිරීම
තෙල් ගබඩා කිරීම
වඩු කර්මාන්ත ශාලාවක් තබාගැනීම
දර මඩුවක් තබාගැනීම
දුම්කොළ ගබඩා කිරීම
ගුවන්විදුලි යන්ත්‍ර අළුත්වැඩියා කිරීම සඳහා වැඩපළක් තබාගැනීම
බෛලෙක් වැඩපළක් තබාගැනීම
මිණිපෙට්ටි සෑදීම හෝ ගබඩා කිරීම
වාර්නිෂ් හෝ තීන්ත වර්ග ගබඩා කිරීම
පරණ යකඩ ගබඩා කිරීම
පුන්නක්කු හෝ වෙනත් ඕනෑම වර්ගයක් සත්ත්ව ආහාර ගබඩා කිරීම
සිමෙන්ති ගබඩා කිරීම". හා

(2) එහි 2 වැනි ඡේදයේ සඳහන් "පොල්ලෙලි පෙඟවීම පිණිස ("පොල්ලෙලි") කොටුවක් තබාගැනීම" යන කාරණය එක්කම ඊළඟට මෙහි පහත සඳහන් අළුත්කාරණා යෙදීමෙනි. එනම් :—

"අඟුරු සඳහා පොල්කටු පිච්චීම
පොල් කටු අඟුරු ගබඩා කිරීම
ටයර් සහ ටියුබ් වොල්කනයිසින් කිරීමේ ස්ථානයක් තබාගැනීම
විදුලි භාණ්ඩ සෑදීම හෝ අළුත්වැඩියා කිරීම සඳහා ස්ථානයක් තබාගැනීම
ගිණිකෙළි භාණ්ඩ සෑදීම හෝ ගබඩා කිරීම."

## අය-වැය ලේඛන

### හොරණ පළාත් ආණ්ඩු සභාව

#### 1959 වර්ෂයේ දෙවැනි අතිරේක අයවැය ලේඛනය

| ශීර්ෂ හා අනු ශීර්ෂ | මුදල රු. ශ. | අවසරය |
|---|---|---|
| බී.—මහා මාර්ග :— | | |
| (2) නඩත්තුකිරීම ... ... ... ... | 2,600 00 | ... 2.5.59 වන දින යෝජනා අංක 9 |
| (4) ආලෝක කිරීම ... ... ... ... | 1,000 0 | ... 4.7.59 වන දින යෝජනා අංක 6 |
| ඩී.—නගර සහා ඉඩම් හා ගොඩනැගිලි :— (අන්තැනක වැය නොවන) | | |
| (8) නව කර්මාන්ත ... ... ... ... | 10,000 0 | ... 2.5.59 වන දින යෝජනා අංක 7 |
| | 31,400 0 | ... 6.6.59 වන දින යෝජනා අංක 8 |
| ඊ.—මහජන සනීපාරක්ෂාව :— | | |
| (1) සාමාන්‍ය | | |
| (ජී) කාණු ඉදි කිරීම ... ... ... | 2,975 0 | ... 2.5.59 වන දින යෝජනා අංක 6 |
| (5) ජල සම්පාදනය :— | | |
| (බී) සකුකොට ගැනීම ... ... ... | 250 0 | ... 6.6.59 වන දින යෝජනා අංක 6 |
| ජේ.—විදුලි බල කාර්යාංශය— | | |
| (4) පාලන හා සාමාන්‍ය වියදම් | | |
| (බී) විවිධ වියදම් ... ... ... ... | 133 25 | ... 2.5.59 වන දින යෝජනා අංක 10 |

1959 මැයි මස 2 වැනි දින, 1959 ජූනි මස 6 වැනි දින සහ 1959 ජූලි මස 4 වැනි දින පවත්වන ලද රැස්වීම්හිදී සම්මත කැරිණි.

ඩබ්ලිව්. ඇම්. පොන්සේකා,
හොරණ පළාත් ආණ්ඩු සභාවේ සභාපති.

පළාත් ආණ්ඩු සභා කාර්යාලය,
හොරණ, 31.7.59.

## විවිධ දැන්වීම්

### කම්මල් පත්තු ගම්කාරක සභාව

#### මස් පිණිස සතුන් මැරීම පිළිබඳ ආඥාපණත

මෙහි පහත විස්තර දැක්වෙන උප ලේඛණයෙහි සඳහන් අයවලුන් විසින් මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා 1959 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම්කර තිබෙන බවත් මෙම බලපත්‍රය නිකුත් කිරීමට විරුද්ධවන කම්මල් පත්තු ගම්කාරකසභා ප්‍රදේශය තුළ පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධ වන්නේ අසවල් කරුණු නිසායයි ලියවිල්ලක් පිටපත් දෙකක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයෙහි පළවන දින සිට දහ හතර දිනක් ඇතුළත මා වෙත එවීමට බලය තිබෙන බවත් මස් පිණිස සතුන් මැරීම පිළිබඳ ආඥා පණතේ 201 වැනි පරිච්ඡේදයේ අංක 7 දරණ 1947 අංක 44 දරණ ආඥා පණතින් සංශෝධිතවූ අංක 6 දරණ ආඥා පණත යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඩබ්ලිව්. අයි. හියු. ප්‍රනාන්දු,
කම්මල් පත්තු ගම්කාරක සභාවේ ප්‍රධාන තැන.

වර්ෂ 1959ක්වූ අගෝස්තු මස 3 දින
කම්මල් පත්තු ගම්කාරක සභා කාර්යාලයේ දීය,
දුම්මලදෙනිය, වෙන්නප්පුව.

#### උපලේඛනය

| ඉල්ලුම්කරු | පදිංචි ස්ථානය | මැරීමට අදහස් කරන සතුන් |
|---|---|---|
| ව. නි. මර්තිනු ප්‍රනාන්දු | බ. දුම්මලදෙනිය | හරක් එළුවන් ඌරන් |

## බින්තැන්න ගම් කාර්‍ය සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දැක්වෙන උප ලේඛනයෙහි සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා විකිණීම පිණිස 1959 වර්ෂයට බල පත්‍රයක් ඉල්ලුම් කර තිබෙන බවත්, මෙම බල පත්‍රය නිකුත් කිරීමට විරුද්ධව බින්තැන්න ගම් කාර්‍ය සභා ප්‍රදේශය ඇතුළත ඕනෑම කෙනෙකුට, තමා ඒ සඳහා විරුද්ධවන්නේ අසවල් කරුණු නිසායයි දැක්වෙන ලියවිල්ලක්, පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට 14 දිනක් ඇතුළත මා වෙත ඉදිරිපත් කිරීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 වෙනි පරිච්ඡේදයේ අංක 7 දරණ 1947 අංක 44 ආඥාපනතින් සංශෝධිතවූ අංක 6 දරණ වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | ස්ථානය | වෙළඳාම |
|---|---|---|
| ඇස්. අබ්දුල් කාදර් | පහරගම්මන | හරක් මස් |

ඩබ්ලිව්. ඇම්. ජේපාන්සේකා,
බින්තැන්න ගම්කාර්‍ය සභාවේ සභාපති.

බින්තැන්න ගම්කාර්‍ය සභා කාර්‍යාලය,
මහියංගණය, 16.7.1959.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.